පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය: 290

ආයතනයේ නම : බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ඇඟුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු. ආයතනය භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்க: 290

நிறுவனத்தின் பெயர்: புத்தசாசனம், மத மற்றும் கலாசார அலுவல்கள் அமைச்சு

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் நிறுவனங்களிற்குப் பொறுப்பான கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliament Series No: 290

Name of the Institution: Ministry of Buddhasasana, Religious and Cultural Affairs

Submission of observations of Hon. Minister in charge of the institutions and steps taken with regards to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

1. ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
2. බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය - බුද්ධශාසන හා ආගමික කටයුතු අංශය
3. බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය - සංස්කෘතික කටයුතු අංශය
4. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
5. මහා භාරකාර දෙපාර්තමේන්තුව
6. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
7. ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව
8. මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
9. බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව
10. හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
11. ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව
12. ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

புத்தசாசனம்,மதமற்றும் கலாசார அலுவல்கள் அமைச்சு

1. தேசிய மரபுரிமைகள், இரங்குக் கலைகள் மற்றும் கிராமியக் கலைகள் மேம்பாட்டு இராஜாங்க அமைச்சு
2. புத்தசாசனம், மத மறறும் கலாசார அலுவல்கள் அமைச்சு - புத்தசாசனம் மற்றும் மத விவகார பிரிவு
3. புத்தசாசனம், மத மறறும் கலாசார அலுவல்கள் அமைச்சு - கலாசார விவகார பிலிவு
4. தொல்பொருளியல் திணைக்களம்
5. பொது நம்பிக்கைப் பொறுப்பாளர் திணைக்களம்
6. கலாசார அலுவல்கள் திணைக்களம
7. தேசிய சுவடிகள் காப்பக திணைக்களம்
8. முஸ்லிம் சமய, பண்பாட்டலுவல்பள் திணைக்களம்
9. பௌத்த அலுவல்கள் திணைக்களம்
10. இந்து சமய கலாசார அலுவல்கள் திணைக்களம்
11. தேசிய நூதனசாலைபள் திணைக்களம்
12. கிறிஸ்தவ மத அலுவல்கள் திணைக்களம்

Ministry of Buddhasasana, Religious and Cultural Affairs

1. State Ministry of National Heritage, Performing Arts and Rural Arts Promotion
2. Ministry of Buddhasasana, Religious and Cultural Affairs – Section of Buddhasasana and Religious Affairs
3. Ministry of Buddhasasana, Religious and Cultural Affairs – Section of Cultural Affairs
4. Department of Archaeology
5. Department of Public Trustee
6. Department of Cultural Affairs
7. Department of National Archives
8. Department of Muslim Religious and Cultural Affairs
9. Department of Buddhist Affairs
10. Department of Hindu Religious and Cultural Affairs
11. Department of National Museum
12. Department of Christian Religious Affairs

රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තා සම්බන්ධයෙන් නිරීක්ෂණ හා පියවර ගැනීම - පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 290 – 2021 ගිණුම් වර්ෂය

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 290

ආයතනයේ නම : ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

	කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු / කාරක සභාව විසින් ලබා දෙන ලද නියෝග	අඩුපාඩු නිවැරදි කිරීමට කමිටුව විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග/නිර්දේශ ක්‍රියාත්මක කිරීම/ වර්තමාන තත්ත්වය
1	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	2020 අගෝස්තු මස 09 දින අභිනවයෙන් ස්ථාපිත වූ ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී රාජ්‍ය අමාත්‍යාංශය සඳහා 2021 ගිණුම් වර්ෂයට අදාළව 2022 වර්ෂය තුළ ලැබුණු බොහොමයක් විගණන විමසුම් සඳහා මාසයක කාලයක් තුළ පිළිතුරු ඉදිරිපත් කර ඇත. ඇතැම් විගණන විමසුම් ජාතික උරුම රාජ්‍ය අමාත්‍යාංශය යටතේ වන ආයතනයන්ට අදාළ වූ බැවින් එම ආයතන ප්‍රධානීන් මඟින් පිළිතුරු කැඳවා ඒ අනුව ජාතික උරුම අංශය විසින් පිළිතුරු ලබාදීමේ දී මාස 02ක් පමණ කාලයක් ගතවී ඇත. මේ වන විට ලැබෙන විගණන විමසුම් සඳහා නියමිත දිනට පෙර පිළිතුරු යැවීමට කටයුතු කරනු ලැබේ.
2	මු.රෙ. 134 (2) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	ජාතික උරුම රාජ්‍ය අමාත්‍යාංශය ස්ථාපිතව පැවති අවස්ථාවේ මෙම අමාත්‍යාංශය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද කාර්ය මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණන තනතුරක් නොතිබුණ අතර, ඒ අනුව අභ්‍යන්තර විගණන අංශයක් ද ස්ථාපිතව නොතිබිණි. ඒ අනුව 2021 මුදල් වර්ෂයට අදාළව අභ්‍යන්තර විගණනයක් සිදුවී නොමැත.
3	2017.06.26 දිනැති අංක 1/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2018 වර්ෂයේ දී මිලදී ගැනීම් සිදුකර ඇත්තේ එවකට ජාතික උරුම අංශයක් ලෙස ස්ථාපිතව පැවති අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වේ. වර්තමානයේදී සිගාස් දත්ත පද්ධතිය හරහා මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කෙරේ.

4	2017.06.26 දිනැති අංක 1/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු නිලධාරියෙකු පත්කර කොමිස්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත දන්වා නොතිබුණි.	මේ වන විට ජාතික උරුම අංශයේ ප්‍රධාන ගණකාධිකාරී 'සම්බන්ධීකරණ නිලධාරී' ලෙස පත්කර ඇත.
5	2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මු.රෙ. 756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2020, 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. 2023 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණය සඳහා මූලික කටයුතු ආරම්භ කර ඇත.
6	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	2022 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණයට අනුව අතිරික්ත හා ඌනතා හඳුනාගෙන ඇති අතර, එම නිර්දේශයන් අනුව ඉදිරි කටයුතු කර ඇත.
7	සියලු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	මේ වන විට වාහනවල රාජ්‍ය ලාංඡනය අලවා ඇත.
8	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි.	සියළු වාහන සඳහා ඉන්ධන දහන පරීක්ෂාවන් සිදු කිරීම ආරම්භ කර ඇත.
9	නිහතිටි ණය ශේෂ වල කාල විශ්ලේෂණයක් සකස් කර නොතිබුණි.	2021 මූල්‍ය වර්ෂයට අදාළව 2022 වර්ෂයේ සකස් කල රජයේ අත්තිකාරම් 'බී' ගිණුම් වාර්තාවේ ඇමුණුම 3.3 යටතේ කාල විශ්ලේෂණය කර දක්වා ඇත.
10	2017.09.20 දිනැති 2017 අංක 04 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව කාර්ය මණ්ඩල තොරතුරු කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුළත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර නොතිබුණි.	වර්තමානයේ සෑම කාර්තුවක් අවසානයේම කාර්ය මණ්ඩල තොරතුරු කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කර ඇත.
11	මහජනයා විසින් ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබාදීම / ලබානොදීම සම්බන්ධව විස්තර ඇතුළත් ලේඛනයක් පවත්වා නොතිබුණි.	මහජනයා විසින් ඉල්ලා සිටින තොරතුරු සම්බන්ධ ලේඛනයක් 2023 වර්ෂයේ සිට පවත්වා ගෙන යනු ලබයි.

12	ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා නොදීම සම්බන්ධව ඉදිරිපත් වන පැමිණිලි ලේඛනගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලේඛන පවත්වා නොතිබුණි.	ඉහතින් සඳහන් කරන ලද තොරතුරු ලේඛනයෙහිම තොරතුරු ලබා නොදීම සම්බන්ධ පැමිණිලි පිළිබඳ තොරතුරු හා ගනු ලබන ක්‍රියාමාර්ගයන්ද ඇතුළත් කරමින් අදාළ ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යනු ලැබේ.
13	පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	2024 වර්ෂයේ සිට පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ.
14	ආයතනයේ පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	2024 වර්ෂයේ සිට ඒ සඳහා වන ක්‍රමවේදයක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.
15	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	2023.11.30 දිනැතිව නිකුත් කරන ලද රා. පරි. ව. 02/2018(I) ප්‍රකාරව 2024 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර ඇත.
16	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	2024 මානව සම්පත් සංවර්ධන සැලැස්මෙහි කාර්ය මණ්ඩලය සඳහා අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ලබාදීමට සැලසුම් සකස් කර ඇත.
17	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	වාර්ෂික කාර්ය සාධනයට ඇතුළත් වන සියලුම මාණ්ඩලික නිලධාරීන්ට අදාළව ගිවිසුම් අත්සන් කර ඇත.
18	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	පැවති මූල්‍ය ප්‍රවාහ තත්ත්වයන් එලෙස පුහුණු අවස්ථා සීමා කිරීමට හේතු වී ඇත.
19	ආයතනයේ ගිණුම් පිළිබඳව විගණන මතය වියාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විය.	විගණනයෙන් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කිරීමටත්, විගණකාධිපති වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමටත් කටයුතු සිදුකර ඇති අතර, අවශ්‍ය පසුවිපරම් හා අධීක්ෂණ ක්‍රියාවලින් සිදුකරනු ලැබේ.
20	විගණකාධිපති වාර්තාවේ නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.	

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 290

ආයතනයේ නම : බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
(බුද්ධශාසන හා ආගමික කටයුතු අංශය)

	කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු / කාරක සභාව විසින් ලබා දෙන ලද නියෝග	අඩුපාඩු නිවැරදි කිරීමට කමිටුව විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග/නිර්දේශ ක්‍රියාත්මක කිරීම/ වර්තමාන තත්ත්වය
1	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	2022 වර්ෂයේ අභ්‍යන්තර විගණන විමසුම් 03 ක් ඉදිරිපත් කර ඇති අතර එයින් 02 ක් සඳහා මසක්තුල පිළිතුරු සපයා ඇත. 2023 වර්ෂයේද අභ්‍යන්තර විගණන විමසුම් 03 ක් ඉදිරිපත් කර ඇති අතර එයින් 02 ක් සඳහා මසක්තුල පිළතුරු සපයා ඇත. 2024 වර්ෂයේ සිට අභ්‍යන්තර විගණන විමසුම් සඳහා අතුරු පිළිතුරක් යැවීමට පියවර ගෙන ඇත.
2	2017.06.26 දිනැති අංක 1/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2023 වර්ෂයට අදාළ තොරතුරු නියමිත පරිදි කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත.
3	සියලු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	පින්තාරු නොකළද තාවකාලිකව සවිකල හැකි නාමපුවරු සවිකර ඇත.
4	වාහනයක් ගර්හිත වී මාස 8 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	තක්සේරුගත මුදලට වඩා අඩු මුදල් වලින් ලංසු ලැබී තිබුණු බැවින් අපහරණය කල නොහැකි විය. ඉදිරියේදී සුන්බුන් ලෙස පවතින වාහනයක්සේ සලකා විකිණීම සඳහා කටයුතු සිදු කරනු ලබයි
5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි.	QR කේතය හරහා ඉන්ධන ලබා ගැනීමට සිදුවූ බැවින් ඉන්ධන පරීක්ෂාව සිදු කිරීමට නොහැකි විය. මේ වන විට කමිටුවක් පත් කර අදාළ දහන පරීක්ෂණ සිදු කරමින් පවතී.
6	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	2023.12.31 දිනට පිළියෙල කරන ලද බැංකු සැසඳුම් අනුව ගැලපුම් කලයුතු ශේෂ නොපවතී. අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කර ඇත.

7	නියමිත කාලයෙන් බැහැරව ප්‍රතිපාදන වෙනත් ආයතන වෙත වෙන්කර ඇත.	2023 වර්ෂයේ නිදහස් කරනු ලද එහෙත් භාවිතා නොකරන ලද ප්‍රතිපාදන අමාත්‍යාංශය වෙත පවරා ගෙන ආයතනවලින් කරන ලද ඉල්ලීම් මත අවසන් කාර්තුව තුල නැත ලබාදීමට පියවර ගෙන ඇත. 2024 වර්ෂයට අදාළව අංක 01/2024,2024.01.10 දිනැති මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය නිකුත් කර ඇති වියදම් පාලන චක්‍රලේඛය හා මු.රෙ.208 ප්‍රකාරව අවශ්‍ය අනුමැතීන් ලබාගෙන අවසාන කාර්තුව තුලදී ඉල්ලුම් කරනු ලබන ප්‍රතිපාදන නිදහස් කිරීමට පියවර ගනු ඇත.
8	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟණය ශේෂ පැවතුනි.	කාර්යාල සේවක සේවයේ ජී.එස්.එම්. කරුණාරත්න මහතා වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක් වෙත යොමු කිරීමට කටයුතු සිදු කර ඇති අතර, එමඟින් ලැබෙන තීරණය අනුව හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු සිදු කරනු ලැබේ. වැඩ තහනම් කරන ලද කාර්යාල සේවක සේවයේ එම්.එච් සුනිත් මහතාගෙන් අයවිය යුතු හිඟ ණය ශේෂය වන රු. 24,155ක මුදල ගෙවා අවසන් කරන ලෙස නැවත 2023.09.19 දිනැතිව දන්වා යවා ඇත.
9	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	මු රෙ 571 ප්‍රකාරව කටයුතු කර නිදහස් කල හැකි තැන්පත් නිදහස් කර ඇත.
10	මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	2021 වර්ෂයේ පැවති මෙම තත්ත්වය 2022 වර්ෂයේදී නිවැරදි කර ගැනීමට පියවර ගෙන ඇත. ඒ අනුව 2023 වර්ෂයේ දී ලබාදුන් තත්කාර්ය අතුරු අග්‍රිම නියමාකාරයෙන් පියවීමට කටයුතු කර ඇත.
11	අනුමත අග්‍රිම ගිණුම් ශේෂ භාණ්ඩගාරයේ පොත් සමඟ කාර්තුමය වශයෙන් සසඳනු ලබන අක්මුදල් සැසැඳුම් ප්‍රකාශය නියමිත දිනට පෙර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව ඉදිරිපත් කර නොතිබුණි.	2022 වර්ෂයේ සිට නියමිත දිනට පෙර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට පියවර ගන්නා ලදී.
12	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.	අනුමත සීමාව තුළ කාර්ය මණ්ඩල පවතී.

13	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය වියාචන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විය.	විගණන මතයට හේතු වූ කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කර ගැනීමට ක්‍රියා කර ඇත.
14	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	2.7 අ (ii) වැඩ තහනම් කරන ලද කාර්යාල සේවක සේවයේ නියුතු එම්.එච් සුනිත් මහතාගෙන් අයවිය යුතු හිඟ ණය ශේෂය වන රු. 24,155ක මුදල ගෙවා අවසන් කරන ලෙස නැවත 2023.09.19 දිනැතිව දන්වා යවා ඇත. (ආ) (v) 2022.05.20 දින තිදෙනෙකුගෙන් සමන්විත සමීක්ෂණ මණ්ඩලයක් යටතේ වාහන සමීක්ෂණයන් සිදුකර ඇති අතර ඒ වන විට බුද්ධශාසන අංශය සතුව තිබූ වාහන 27කට අදාළව වාහන සමීක්ෂණය සිදු කර ඇත. එම වාර්තාවේ අප අංශයට අදාළ අනෙකුත් නිර්දේශ ක්‍රියාත්මක කර ඇත.
15	රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ / නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි.	වැඩ තහනම් කරන ලද කාර්යාල සේවක සේවයේ නියුතු එම්.එච් සුනිත් මහතාගෙන් අයවිය යුතු හිඟ ණය ශේෂය වන රු. 24,155ක මුදල ගෙවා අවසන් කරන ලෙස නැවත 2023.09.19 දිනැතිව දන්වා යවා ඇත. එම වාර්තාවේ අප අංශයට අදාළ අනෙකුත් නිර්දේශ ක්‍රියාත්මක කර ඇත.
16	සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී.
17	උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරුකර යැවීමට කටයුතු කර නොතිබුණි.	2024 වාර්ෂික ස්ථාන මාරු යටතේ වසර 5 කට වැඩි සේවා කාලයක් සේවය කරන ලද සංවර්ධන නිලධාරීන්ගේ තොරතුරු රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත යවා ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 290

ආයතනයේ නම : බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

(සංස්කෘතික කටයුතු අංශය)

	කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු / කාරක සභාව විසින් ලබා දෙන ලද නියෝග	අඩුපාඩු නිවැරදි කිරීමට කම්ටුව විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග/නිර්දේශ ක්‍රියාත්මක කිරීම/ වර්තමාන තත්ත්වය
1	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	2023 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන විමසුම් 04 ක් ලැබී ඇත. එයින් විගණන විමසුම් 03ක් සඳහා පිළිතුරු යොමු කර ඇති අතර ප්‍රාදේශීය සංස්කෘතික මධ්‍යස්ථාන කේන්ද්‍රගත කර ඉදිරිපත් කර තිබූ අභ්‍යන්තර විගණන විමසුම් වේ. ඒ අනුව ප්‍රාදේශීය සංස්කෘතික මධ්‍යස්ථාන හරහා අදාළ නිරීක්ෂණයන් ලබා ගෙන පිළිතුරු සකස් කළ යුතුව තිබූ හෙයින් ඒ සඳහා මසකට වඩා වැඩි කාලයක් ගත වී ඇත. මෙවැනි අවස්ථා වලදී අතුරු පිළිතුරක් යැවීමට පියවර ගෙන ඇත.
2	2017.06.26 දිනැති අංක 1/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොමිස්ත්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	මිල දී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොමිස්ත්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත.
3	සියලු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	සංචිතයේ වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර ඇත. එයට අමතරව පින්තාරු නොකළද තාවකාලිකව සවිකල හැති නාමපුවරු සවිකර ඇත.
4	වාහනයක් ගර්හිත වී මාස 8 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	ගර්හිත තත්ත්වයේ ඇති වාහන වලින් YY-8971අංක දරන ත්‍රීරෝද රථය 2023.01.10 දින අපහරණය සිදු කර ඇත. එයට අමතරව තිබූ 301-4103 දරණ රථය වැඩි මිල ගණන් ඉදිරිපත් කර තිබූ ලංසුකරු මිලදී ගැනීම ප්‍රතික්ෂේප කළ බැවින් අපහරණය කිරීමට නොහැකි විය. 18-7052 දරණ රථය රජයේ තක්සේරු මුදලට ලංසු ඉදිරිපත් වී නොතිබුණි. නැවතත් බුද්ධශාසන අංශය මඟින් 2023.10.18 දින සිදු කරනු ලැබූ වාහන අපහරණය සඳහා අංක 301-4103 හා අංක 18-7052 දරණ රථයන් යොමු කරන ලද අතර එහිදී අංක 301-4103 දරණ රථය වැඩිම වටිනාකමට විකිණීම

		සිදු කර ඇත. නමුත් එහිදී ද 18-7052 දරණ රථය සඳහා රජයේ තක්සේරු මුදලට ලංසු ඉදිරිපත් වී නොතිබුණි. එබැවින් නැවතත් එම රථය තක්සේරු කර අපහරණයට යොමු කිරීමට කටයුතු කරමින් පවතී.
5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි.	2024 මුල් කාර්තුව අවසන් වීමට ප්‍රථම ඉන්ධන දහන පරීක්ෂාව සිදු කිරීමට අවශ්‍ය මූලික ක්‍රියාමාර්ග මේ වන විට සිදු කරමින් පවතී.
6	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	2021 වර්ෂයේ බැංකු සැසඳුම් ප්‍රකාශනවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ මේ වන විට නිරවුල් කර ඇත. 2022 හා 2023 වර්ෂවලට අදාළව ද මු.රෙ.395 හා මු.රෙ.396 ප්‍රකාරව නියමිත කාලය තුළ බැංකු සැසඳුම් ප්‍රකාශන වලින් අනාවරණය වූ ගැලපුම් සම්බන්ධයෙන් කටයුතු කර ඇත.
7	නියමිත කාලයෙන් බැහැරව ප්‍රතිපාදන වෙනත් ආයතන වෙත වෙන්කර ඇත.	2024 වසරේ සිට පළමු සහ දෙවන කාර්තු ඇතුළත සියලු ප්‍රතිපාදන නිදහස් කිරීමට කටයුතු සංවිධානය කර ඇත.
8	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟණය ශේෂ පැවතුනි.	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව ඇමුණුම - 01 මගින් පැහැදිලි කර ඇත. (මේ සමඟ අමුණා ඇත.)
9	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	6000-0-0-13-0-138 (තෙවන පාර්ශවය වෙනුවෙන් තාවකාලික රඳවා ගන්නා තැන්පතු) මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර ඇත. 6000-0-0-16-0-73(කොන්ත්‍රාත් රැඳවුම් තැන්පතු) තවමත් ඉදිකිරීම් කටයුතු සිදු කරන බැවින් (සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය) රැඳවුම් තැන්පතු නිදහස් කර නැත.
10	මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	මේ වන විට තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කිරීමට කටයුතු කර ඇත.
11	අනුමත අග්‍රිම ගිණුම් ශේෂ භාණ්ඩාගාරයේ පොත් සමඟ කාර්තුමය වශයෙන් සසඳනු ලබන අක්මුදල් සැසඳුම් ප්‍රකාශය නියමිත දිනට පෙර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව ඉදිරිපත් කර නොතිබුණි.	බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් කාර්තුමය වශයෙන් සසඳනු ලබන අක්මුදල් සැසඳුම් ප්‍රකාශ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන අතර සංස්කෘතික කටයුතු අංශය මගින් වෙනම ඉදිරිපත් කිරීමක් සිදු නොකෙරේ.

12	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.	මේ වනවිට අනුමත සීමාව ඉක්මවා කිසිදු තනතුරක අතිරික්ත කාර්ය මණ්ඩලයක් නොමැති අතර තනතුරු 09කට අදාළව පුරප්පාඩු පවතී.
13	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය වියාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විය.	අමාත්‍යාංශයේ සංස්කෘතික කටයුතු අංශය සඳහා 2021 හා 2022 වර්ෂ වෙනුවෙන් තත්ත්වාගණනය කළ විගණන මතයක් ඉදිරිපත් කර ඇත. විගණන මතයට හේතු වූ කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරමින් එවා නිවැරදි කර ගැනීමට ක්‍රියාකර ඇත.
14	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.
15	රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ / නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි.	රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ/ නියෝග කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.
16	සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	මේ වනවිට මාණ්ඩලික නිලධාරීන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇත.
17	උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරුකර යැවීමට කටයුතු කර නොතිබුණි.	2024 සිට නිලධාරීන්ගේ ස්ථානමාරු වීම් සම්බන්ධයෙන් නිසි පරිදි කටයුතු කිරීම සඳහා පියවර ගෙන ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 290

ආයතනයේ නම : පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

	කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු / කාරක සභාව විසින් ලබා දෙන ලද නියෝග	අඩුපාඩු නිවැරදි කිරීමට කම්ටුව විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග/නිර්දේශ ක්‍රියාත්මක කිරීම/ වර්තමාන තත්ත්වය
1	ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ආයතනය සතුව ස්ථාවර වත්කම් ලේඛනයක් පවතී. ඒ සඳහා තොරතුරු කැඳවීමක් සිදු කර ඇති අතර ලැබෙන තොරුතුරු මත පද්ධතිය යාවත්කාලීන කිරීමට නියමිතය.
2	හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	2023 වසරේ හානි ලේඛනයක් පිළියෙල කිරීම ආරම්භ කර ඇත. ඒ සඳහා තොරතුරු කැඳවීමක් සිදු කර ඇති අතර ලැබෙන තොරුතුරු මත පද්ධතිය යාවත්කාලීන කරනු ලැබේ.
3	2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛය ප්‍රකාර රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ පලවෙනි මුරපදය ගණකාධිකාරී හෝ අවසර ලත් මාණ්ඩලික නිලධාරියෙකු පමණක් භාවිතා කර නොතිබුණි.	මෘදුකාංගයට අදාළ පලවෙනි මුරපදය අවසර ලත් මාණ්ඩලික නිලධාරියෙකු පමණක් භාවිතා කරයි.

4	2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛය ප්‍රකාර රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ පලමු දෙවන සහ තෙවන මුරපද තුන්මසකට වරක් වෙනස් කර නොතිබුණි.	පළමු දෙවන සහ තෙවන මුරපද තුන්මසකට වරක් වෙනස් කර ඇත.
5	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	ප්‍රාදේශිය කාර්යාල වෙතින් පිළිතුරු ලබා ගැනීමේදී ප්‍රමාදයන් ඇතිවන අතර, අතුරු පිළිතුරක් ඉදිරිපත් කිරීමට පියවර ගනු ලැබිය.
6	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	
7	සියළු වාහන වල අයිතිය තහවුරු කරන ලිපි සන්තනයේ නොමැත.	දැනට දෙපාර්තමේන්තුව සතුව වාහන 98 ක් පවතී. ඉන් 52 ක් යතුරු පැදි වන අතර 46 ක් සෙසු වාහන වේ. දැනට දෙපාර්තමේන්තුව සතුව ලියාපදිංචි අයිතිය පවතින වාහන 95 ක් ද වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සතුව පවතින වාහන 03 ක් වේ. එසේ දෙපාර්තමේන්තුව සතුව අයිතිය නොපවතින වාහනවල ලියාපදිංචි අයිතිය නීත්‍යානුකූලව පවරා ගැනීම සඳහා කටයුතු කරමින් පවති. එමෙන්ම අයිතිය සනාථ කළ නොහැකි රථ වාහන කිසිවක් දෙපාර්තමේන්තුව සතුව නොමැත.
8	සංචිත වාහන සඳහා දෛනික ධාවන කාල සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2024 වසරේ සිට දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ වාර්තා විගණනයට ඉදිරිපත් කිරීමට පියවර ගනු ලැබේ.
9	සියලු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	සියලුම රථ වාහනවල බඳෙහි දෙපාර්තමේන්තු නිල නාමය සහ රාජ්‍ය ලාංඡනය මුද්‍රණය කිරීම සඳහා පියවර ගෙන ඇත.
10	වාහනයක් ගර්හිත වී මාස 08කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	දෙපාර්තමේන්තුවේ අපහරණය කළ යුතු වාහන හඳුනාගැනීම සඳහා පත් කළ විශේෂ සමීක්ෂණ මණ්ඩලයේ වාර්තාව (2023.08.11 දිනැතිව) අනුව අපහරණය කළ යුතු වාහන 4 ක් හඳුනාගෙන ඇති අතර චක්‍රලේඛ ප්‍රකාරව ඉදිරි කටයුතු ඉටුකිරීමට නියමිතය.
11	සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි.	ලොග් සටහන් පොත් නියමිත පරිදි යාවත්කාලීන කිරීමට කටයුතු කරමින් පවතියි.
12	බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනයට පිළියෙල කර සහතික කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.	2024 ජනවාරි බැංකු සැසඳුම් ප්‍රකාශය 2024.02.14 දින විගණනය වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව ඉදිරියේදී නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ ඉදිරිපත් කරනු ලැබේ.

13	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කල යුතුව තිබූ ශේෂ මේ වන විට නිරවුල් කර ඇත.
14	ප්‍රතිපාදන සීමාව ඉක්මවා වියදම් දැරීම සිදුව තිබුණි.	2023 වර්ෂයේ දී ප්‍රතිපාදන සීමාව ඉක්මවා වියදම් දරා නැත.
15	මු.රෙ. 94(1) ප්‍රකාරව වැය විෂයයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇති කර ගෙන තිබුණි.	2023 වර්ෂයේ දී ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇතිකර ගෙන නැත.
16	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන නිහඬය ශේෂ පැවතුණි.	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන නිහඬය ශේෂ මේ වන විට නිරවුල් කිරීමට කටයුතු කර ඇත.
17	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කිරීමට කටයුතු කර ඇත.
18	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.	අනුමත සීමාව තුළ බඳවාගැනීම් සිදුකර ඇත.
19	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ආවරණය වන පරිදි වැඩසටහන් සංවිධානය කිරීමට කටයුතු කර ඇත.
20	සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	පවතින ප්‍රතිපාදන සීමාව තුළ පුහුණු සැලැස්මට අනුකූලව වැඩසටහන් පැවැත්වීමට අවධානය යොමුකළ යුතු අතර, අවශ්‍යතාවය හා ප්‍රමුඛතාවය මත ඇතැම් අවස්ථාවල දී සැලසුම්ගත පුහුණු වැඩසටහන් වලින් පරිබාහිර අත්‍යවශ්‍ය යැයි අංශ ප්‍රධානීන් හා ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂවරුන් විසින් හඳුනාගනු ලැබූ පුහුණු ඉල්ලීම් සඳහා අවස්ථාව ලබා දී ඇති අතර ඒ අනුව සැලසුම්ගත පුහුණු වැඩසටහන් ප්‍රතිශතයේ 100% වෙත ළඟා වීමට නොහැකි වී ඇත. 2024 වසර සඳහා අත්‍යවශ්‍ය යැයි හඳුනාගනු ලබන පුහුණු අවස්ථා සඳහා ප්‍රමුඛතාව ලබා දී කටයුතු කිරීමට සැලසුම් කර ඇත.

21	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය වියාචන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විය.	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, හිතකර මතයකි.
22	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	අඩුපාඩු / දෝෂ බොහොමයක් මේ වන විට නිවැරදි කර ඇති අතර, අනෙකුත් අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී.
23	රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ/ නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි.	නිර්දේශ / නියෝග ක්‍රියාත්මක කිරීම අදාළ පාර්ශවයන් වෙත උපදෙස් ලබා දී ඇති අතර ඒ අනුව ක්‍රියාත්මක වෙමින් පවතී.
24	නිලධාරීන්ගෙන් රජයට සිදු වූ පාඩු වෙනුවෙන් මු.රෙ. 156(1) ප්‍රකාරව අය කිරීම් කර නොතිබුණි.	රජයට සිදු වූ පාඩු පිළිබඳ මෙතෙක් වාර්තා වී නොමැත.
25	මු.රෙ. 119 ප්‍රකාරව අය කළ යුතු අධිභාර අයකර නොතිබුණි.	අය කළ යුතු අධිභාර පිළිබඳ මෙතෙක් වාර්තා වී නොමැත.
26	උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි.	දෙපාර්තමේන්තු ස්ථාන මාරු ක්‍රියා පටිපාටිය අනුව මේවනවිට සේවා කාලය වසර 5 ඉක්ම වූ නිලධාරීන් හට ස්ථාන මාරුවීම් ලබා දී ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 290

ආයතනයේ නම : මහා භාරකාර දෙපාර්තමේන්තුව

	කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු / කාරක සභාව විසින් ලබා දෙන ලද නියෝග	අඩුපාඩු නිවැරදි කිරීමට කම්ටුව විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග/නිර්දේශ ක්‍රියාත්මක කිරීම/ වර්තමාන තත්ත්වය
1	2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මු.රෙ.756 (6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2021, 2022 වර්ෂ වල භාණ්ඩ සමීක්ෂණ වාර්තා මේ වන විට රජයේ විගණන අංශය වෙත යොමු කර ඇති අතර 2023 වසරේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු සඳහා සමීක්ෂණ මණ්ඩල මේ වන විට පත් කර ඇත. දැනට සමීක්ෂණ කටයුතු සිදු කෙරෙමින් පවතී. 2023 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට දැනට සැලසුම් කර ඇත.
2	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	පසුගිය භාණ්ඩ සමීක්ෂණයෙන් පෙන්වා දෙන ලද නිර්දේශ මේ වන විට ක්‍රියාත්මක කර ඇත.
3	සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ යනාමැත.	සියලු වාහන වල අයිතිය තහවුරු කරන ලිපි ආයතනය සතුව ඇත.

4	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් විගණන කටයුතු සඳහා ඉදිරිපත් කර ඇති අතර මාසික සාරාංශ වාර්තාද සකස් කර ඇත.
5	සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	සියළු වාහනවල රාජ්‍ය ලාංඡනය මුද්‍රණය කර ඇත.
6	ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා නොදීම සම්බන්ධව ඉදිරිපත් වන පැමිණිලි ලේඛනගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලේඛන පවත්වා නොතිබුණි.	ලැබෙන ඉල්ලීම් ලේඛන ගත කරන අතර පිළිතුරු යොමු කල පසු ද එහි සටහන් කරනු ලැබේ.
7	ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවිය නිර්මාණය කරමින් පවතී.
8	ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	වෙබ් අඩවිය යාවත්කාලීන කරමින් පවතී. එමඟින් මහජන අදහස් දැන්වීමට අවස්ථාවක් ලබාදීමට සැලසුම් කර ඇත.
9	පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියයල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	මේ සම්බන්ධව කටයුතු කරමින් පවතී.
10	ආයතනයේ පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	මේ සම්බන්ධව කටයුතු කරමින් පවතී.
11	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	2023 / 2024 වර්ෂ වලට අදාලව මානව සම්පත් සැලැස්ම සකස් කර ඇත.
12	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	2023/2024 වෙනුවෙන් සකස් කර ඇති මානව සම්පත් සැලැස්ම තුළ අවම පැය 12 ක් ඇතුළත් වන පරිදි පුහුණු අවස්ථා ඇතුළත් කර ඇත.
13	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	කාර්ය සාධන ගිවිසුම් මඟින් ගිවිසුම්ගත වීමට කටයුතු කර ඇත.

14	මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටද ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරයෙකු නම් කර නොතිබුණි.	පාලන අංශය අංශයේ පැවති නිලධාරී පුරප්පාඩු මත උනතා පැවතිය ද දැනට දෙපාර්තමේන්තුවේ "පරිපාලන නිලධාරී" ඒ සඳහා පත් කර ඇත.
15	සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2023 වසරේ සිට සැලසුම් ගත පරිදි පුහුණු කිරීම් සිදු කිරීම සිදුවේ.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 290

ආයතනයේ නම : සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

	කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු / කාරක සභාව විසින් ලබා දෙන ලද නියෝග	අඩුපාඩු නිවැරදි කිරීමට කමිටුව විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග/නිර්දේශ ක්‍රියාත්මක කිරීම/ වර්තමාන තත්ත්වය
1	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	පැවති අඩුපාඩු මහහරවා ගෙන සියළුම විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු ලබාදීමට පියවර ගෙන ඇත.
2	මු.රෙ. 134 (2) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අභ්‍යන්තර විගණක තනතුර කාලයක සිට පුරප්පාඩුව පවතින අතර ඒ සඳහා නිලධාරියෙකු අනුයුක්ත කර දෙන ලෙසට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත ඉල්ලීම් සිදු කර ඇත.
3	2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මු.රෙ.756 (6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2022 වර්ෂයේ දී නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලද අතර 2023 වසර භාණ්ඩ සමීක්ෂණය සඳහා මූලික කටයුතු ආරම්භ කර ඇත.
4	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි.	මේ වන විට වාහන 14ක් සඳහා ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර ඇති අතර, ඉදිරියේදී ඉතිරි වාහන සඳහාද ඉන්ධන දහන පරීක්ෂාව සිදු කිරීමට නියමිතය.
5	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	අවුරුදු 20කට වඩා වැඩි ශේෂ සහිත නිලධාරීන්ගේ තොරතුරු අනාවරණය නොවීම නිසා එම ශේෂ අයකර ගැනීමට අපහසු වී ඇත.

6	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	ඉදිකිරීම් ආයතන වෙත ඉදිකිරීමට භාරදුන් ගොඩනැගිලි ඉදිකිරීම් අවසන් කර භාර දුන් නිසාවෙන් අදාළ උපදේශන ආයතන මඟින් ගෙවීම් අත්හිටුවන ලෙස උපදෙස් දී ඇති අතර එම කොන්ත්‍රාත් තැන්පතු මුදල් හා සෙලාන් බැංකුව හා බැඳුනු රඳවාගත් තැන්පතු මුදල් රජයේ ආදායමට බැර කිරීමට හෝ නිදහස් කිරීමට නොහැකි වී ඇත.
7	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	2021 වසරේ සිට මානව සම්පත් සැලැස්ම පිළියෙල කර ඇත.
8	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයයන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	සකස් කරන ලද මානව සම්පත් සැලැස්මෙහි අවම වශයෙන් වර්ෂයකට පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවන් ඇතුලත් වන පරිදි සැලසුම් සකස් කර ඇත.
9	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	කාර්ය සාධන ගිවිසුම් සකස් කරමින් පවතී.
10	මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටද ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	2023 වසරේදී ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර යවා ඇත.
11	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	පැවති කොවිඩ් තත්ත්වය හේතුවෙන් ජනතාව ඒකරාශී වීම සීමා කිරීම හේතුවෙන් පුහුණු අවස්ථා ප්‍රමාණය 50%කට වඩා අඩු මට්ටමක පැවතුණි. ඉදිරි වසරේ සිට පුහුණු අවස්ථා ලබා දීමට කටයුතු කර ඇත.
12	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය වියාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විය.	2021 වසර සඳහා ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ලෙස දක්වා ඇත්තේ තත්ත්වාගණනය කල මතයක් වේ. පැවති අඩුපාඩු නිවැරදි කර ගනිමින් හිතකර මතයක් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.
13	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	අඩුපාඩු / දෝෂ බොහෝමයක් මේ වන විට නිවැරදි කර ඇති අතර, අනෙකුත් අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී.
14	මු.රෙ.119 ප්‍රකාරව අය කළ යුතු අධිභාර අයකර නොතිබුණි.	අධිභාර අයකිරීම් නොමැත.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 290

ආයතනයේ නම : ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව

	කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු / කාරක සභාව විසින් ලබා දෙන ලද නියෝග	අඩුපාඩු නිවැරදි කිරීමට කමිටුව විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග/නිර්දේශ ක්‍රියාත්මක කිරීම/ වර්තමාන තත්ත්වය
1	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	දැනට මෙම ණය ශේෂ නිරවුල් කිරීම සඳහා අදාළ ආයතන වෙත ලිපි යොමු කර ඇත. ලැබෙන පිළිතුරු මත ණය අය කර ගැනීම හෝ රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව කපා හැරීමට කටයුතු කරනු ලැබේ. මෙතෙක් නිරවුල් නොවී පැවැති ස්ථාන මාරුවී ගිය නිලධාරින්ගේන් අයවිය යුතු ණය ශේෂ සම්බන්ධයෙන් අයවැය චක්‍රලේඛ 118 අනුව ක්‍රියාකර ඇත.
2	හඳුනාගත් තිරසර අරමුණු ඉටු කර ගැනීම සඳහා ළඟා කර ගත යුතු ඉලක්ක තීරණය කර නොතිබුණි.	දෙපාර්තමේන්තුවෙහි පවතින අරමුණු හා කාර්යයන් වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් වන තිරසර සංවර්ධන අරමුණු / ඉලක්ක / සංවර්ධන දර්ශකයන් හඳුනාගැනීම සහ ගැලපීම අපහසු වුවත්, දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යය වන ලිඛිත උරුමය විධිමත්ම කළමනාකරණය සහ ස්ථිර ලෙස සංරක්ෂණය කිරීම සඳහා ඇමුණුමේ දැක්වෙන ලෙස තිරසර සංවර්ධන අරමුණුවලට දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක වන වැඩසටහන්/ ව්‍යාපෘති අනුගත කර ඇත.
3	හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි.	
4	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	සෑම සේවකයෙකු සඳහා අවම වශයෙන් පැය 12 ක පුහුණුවක් අඩංගු වන පරිදි මානව සම්පත් සැලැස්මක් සකස් කර ඇත.
5	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ MBNA/Sec/01 හා 2023/01/23 දිනැති ලිපිය අනුව මෙම දෙපාර්තමේන්තුව වෙත 2023 වර්ෂය වෙනුවෙන් සපුරා ගැනීමට අදාළ ඉලක්ක අඩංගු වන පරිදි සමස්ත කාර්ය මණ්ඩලයම ඇතුලත් කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගත වීමට කටයුතු කර ඇත.
6	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	
7	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාචන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විය.	ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති

		සම්පිණ්ඩන වාර්තාවට අනුව ආයතනයේ ගිණුම් පිළිබඳ තත්ත්වාගණනය කළ මතය ඉදිරිපත් කර ඇති අතර, 2021 වර්ෂයට අදාළ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ නොවිය.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 290

ආයතනයේ නම : මුස්ලිම් ආගමික හා සංස්කෘති කටයුතු දෙපාර්තමේන්තුව

	කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු / කාරක සභාව විසින් ලබා දෙන ලද නියෝග	අඩුපාඩු නිවැරදි කිරීමට කමිටුව විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග/නිර්දේශ ක්‍රියාත්මක කිරීම/ වර්තමාන තත්ත්වය
1	මු.රෙ. 134 (2) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අභ්‍යන්තර විගණක නිලධාරියකු නොමැති වී හා ස්ථිර ගණකාධිකාරිවරයකු නොමැති වීම නිසා දෙපාර්තමේන්තුව මගින් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. කෙසේ වුවද මේ වන විට අභ්‍යන්තර විගණක තනතුරේ වැඩ බැලීම සඳහා අභ්‍යන්ත විගණකවරයකු පත්කර ඇති බැවත් 2024 වර්ෂයේ සිට මු.රෙ. 134(2) ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.
2	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.
3	සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	දෙපාර්තමේන්තුවේ ඇති සංචිත වාහන සියල්ල සඳහා රාජ්‍ය ලාංඡනය මුද්‍රණය කිරීමට කටයුතු කර ඇත.
4	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි.	සියළුම වාහනවල ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවන් සිදු කරන ලදි.
5	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ.ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	බැංකු සැසඳුම් ප්‍රකාශ මගින් අනාවරණය වූ දීර්ඝ කාලයක් පැවති ශේෂ නිරවුල් කර ඇත.
6	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	වර්ෂ 2022 අත්තිකාරම් බී ගිණුම් අනුව වර්ෂයකට වඩා වැඩි ණය ශේෂ 09 ක් පැවති අතර එයින් ණය ශේෂ 02 ක් නිරවුල් කර ඇත. තවත් ණය ශේෂ දෙකක් නිරවුල් කිරීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙන් ප්‍රතිපාදන ලබා දී ඇත. වැරදි වැය ශීර්ෂයකට බැර කර

		ඇති තවත් එක් නිලධාරිනියකුගේ ණය ශේෂය නිවැරදි කිරීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ කටයුතු කරමින් සිටී. දීර්ඝ කාලයක සිට පැවත එන ඉතිරි ණය ශේෂ 04 නිරවුල් කිරීමට කටයුතු කරමින් සිටින බව දන්වා සිටිමි.
7	ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබුණි.	දෙපාර්තමේන්තුවේ තිරසර සංවර්ධන අරමුණු දැනටමත් හඳුනාගෙන ඇති අතර ප්‍රගතිය මැන බැලීම සඳහා වන දර්ශක නියම කිරීමට කටයුතු කර ඇත.
8	හඳුනාගත් තිරසර අරමුණු ඉටු කර ගැනීම සඳහා ළඟා කර ගත යුතු ඉලක්ක තීරණය කර නොතිබුණි.	
9	හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි.	
10	ආයතනයේ පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	ආයතනයේ පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය හා ඇගයීම සඳහා ක්‍රමවේදයක් සකස් කර ඇත.
11	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	2023.11.30 දින දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2023(1) අනුව දෙපාර්තමේන්තුවට අදාලව මානව සම්පත් සංවර්ධන සැලැස්ම සැකසීමේ කටයුතු ආරම්භ කර ඇත. ඒ අනුව අංක 12,13 හා 14 පරිදි තොරතුරු ඇතුලත් කිරීමට නියමිතයි.
12	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	
13	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	
14	මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටද ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරයෙකු නම් කර නොතිබුණි.	

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 290

ආයතනයේ නම : බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව

	කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු / කාරක සභාව විසින් ලබා දෙන ලද නියෝග	අඩුපාඩු නිවැරදි කිරීමට කමිටුව විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග/නිර්දේශ ක්‍රියාත්මක කිරීම/ වර්තමාන තත්ත්වය
1	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	2021 වසරේ නිකුත් කර ඇති අභ්‍යන්තර විගණන විමසුම් 11 අතුරින් රුහුණු කතරගම දේවාලය සහ සෙල්ලකතරගම මහසෙන් රජමහා විහාරය සඳහා මේ වන තෙක් පිළිතුරු ලැබී නොමැත. ඒවාට පිළිතුරු ඉදිරිපත් කරන ලෙස අදාළ සිද්ධස්ථාන භාරකරුවන් වෙත සිහිකැඳවීම් කර ඇත.
2	2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මු.රෙ. 756 (6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2020, 2021 වර්ෂය වල භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකිරීමට අදාළ මුලික කටයුතු සිදු කර ඇත.ඒ අනුව භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර අදාළ වාර්තානියමිතදිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.
3	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	2021.12.31 න් අවසන් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයෙන් අතිරික්ත හා ඌනතා අනාවරණය වී නොමැති අතර අනෙකුත් නිර්දේශයන් වලට අදාළව 2021 වර්ෂයේ භාණ්ඩ අපහරණ කටයුතු දෙසැම්බර් මස තුළදී ක්‍රියාත්මක කර ඇති අතර මෙම වර්ෂය තුළදී භාණ්ඩ සමීක්ෂණ කටයුතු හා අදාළ නිර්දේශයන් නියමිත කාලවකවානු තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.
4	සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	නිලධාරීන්ට වෙන්කර ඇති හා වෙන්කිරීමට ඇති වාහන හැර අනෙකුත් සියළු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර ඇත.
5	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	2024 වර්ෂය සඳහා මානව සම්පත් සැලැස්මක් සකස් කර ඇත.
6	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයයන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	2024 වර්ෂය සඳහා සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම තුළ එක් එක් සේවකයකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12ක පුහුණුවක් සැලසුම් කර ඇත.

7	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	සමස්ථ කාර්ය මණ්ඩලයේ විෂය බෙදීම් හා එම විෂයන් අනුව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ඇත.
8	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2024 වර්ෂය සඳහා සකස් කරන ලද මානව සම්පත් සැලසුම් කර ඇති ආකාරයට සියළු පුහුණු අවස්ථා නිසි පරිදි ලබා දීමට සැලසුම් සකස් කර ඇත.
9	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය වියාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විය.	මේ වන විට අදාළ අඩුපාඩු නිවැරදි කරගෙන ඇති අතර, ඒ අනුව විගණකාධිපති විසින් 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බවට හිතකර මතයක් පල කර ඇත.
10	උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුවේ වර්ෂ පහකට වැඩි නිලධාරීන් ස්ථාන මාරු නොකිරීම සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙතින් කිහිප වතාවක්ම විමසීම් කරන ලද අතර අවුරුදු පහකට වැඩි සියළු නිලධාරීන්ගේ තොරතුරු ද ඒ සමඟ යොමු කර ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 290

ආයතනයේ නම : හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

	කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු / කාරක සභාව විසින් ලබා දෙන ලද නියෝග	අඩුපාඩු නිවැරදි කිරීමට කමිටුව විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග/නිර්දේශ ක්‍රියාත්මක කිරීම/ වර්තමාන තත්ත්වය
1	සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා සමාජ ප්‍රගතිය සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය යටතේ හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව පාලනය වී ඇති කාලයේ, එම අමාත්‍යාංශය මඟින් අංක KF-9142 දරන වාහනය 2019.01.22 වන දින දෙපාර්තමේන්තුවේ භාවිතයට භාරදෙන ලදි. එම වාහනයේ අයිතිය දැනට දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට ඉහත වාහනය අයිතිය දැනට ඇති අධිකරණ අමාත්‍යාංශය වෙත ඉල්ලීම හා අවශ්‍ය ආකෘතිය ඉදිරිපත් කර ඇත.
2	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි.	දෙපාර්තමේන්තුවේ භාවිතයට වාහන තුනක් ඇත. වෑන් (WP NA 9550) - ඉන්ධන දහන පරීක්ෂණයක් සිදු කර ඇත. කාර් (WP KN 1748) - අළුත්වැඩියා කරමින් පවති. කාර් (WP KF – 9142) - ඉන්ධන දහන පරීක්ෂණයක් සිදු කර ඇත.

3	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	දෙපාර්තමේන්තුවේ සේවය කර ස්ථාන මාරු වීම් ලැබූ එස්.සින්නකම්බි, ආරියපාල සහ සිවලිංගම් යන නිළධාරීන්ගේ හිඟ ණය ශේෂ පිළිවෙලින් රුපියල් 15,846.66, රුපියල් 16,163. සහ රුපියල් 14,452.75කි.එම නිළධාරීන් පිළිබඳ විස්තර නොමැති නිසා වසර 31කට වැඩිකාලයක් මෙම මුදල අයකර ගැනීමට නොහැකි විය. 2020/08/28 රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛනය අනුව අංක 01/2020 හි 113(6) දක්වා ඇති විධිවිධාන අනුව හිඟ ශේෂය කපා හැරීමට නියමිතය.
4	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයයන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	දෙපාර්තමේන්තුවේ සියලුම කාර්ය මණ්ඩලය සඳහා දින තුනක පුහුණුවක් 2023 දෙසැම්බර් මාසයේ පුහුණුවක් ලබා දී ඇත.
5	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	
6	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත.
7	උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි.	වාර්ෂික ස්ථාන මාරුවීම් ආකෘතිය අංක C S/A.T/02 අනුව හා අවුරුදු 05කට වඩා වැඩි කාලයක් සේවය කර ඇති නිළධාරීන්ගේ තොරතුරු අංක C.S/A.T/03 දරණ අකෘතිය අනුව සකස් කර රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත යවා ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 290

ආයතනයේ නම : ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

	කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු / කාරක සභාව විසින් ලබා දෙන ලද නියෝග	අඩුපාඩු නිවැරදි කිරීමට කමිටුව විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග/නිර්දේශ ක්‍රියාත්මක කිරීම/ වර්තමාන තත්ත්වය
1	2017.06.26 දිනැති අංක 1/2017 දරන වත්කම් කළමනාකරන චක්‍රලේඛයේ 7 ඡේදයේ ප්‍රකාරව 2018 වර්ෂයේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය යවත ඉදිරිපත් කර නොතිබුණි.	2018 වර්ෂයේදී ඉදිරිපත් කර නැත. 2021, 2022 වර්ෂ වල ඉදිරිපත් කර ඇත.

2	සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	දෙපාර්තමේන්තුව සතු සියළු වාහනවල පින්තාරු හා ස්ටිකර් මඟින් රාජ්‍ය ලාංඡනය ප්‍රදර්ශනය කර ඇත.
3	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි.	මේ වන විට ධාවනයට යොදා ගන්නා සියළුම වාහන වල ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර ඇත. අළුත්වැඩියා කරමින් පවතින 42-8313 ලොරිරථය හා අළුත්වැඩියා කිරීමට වෙන්කර ඇති 32-1126 ජීප්රථයේ ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර නොමැත.
4	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	වර්ෂයකට වඩා වැඩි කාලයක සිටපැවත එන අයකර ගත නොහැකි මුදලක් වන රු. 8,437/-ක් පොතෙක් අස්කර දැමීම සඳහා රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය හා රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 පරිදි කටයුතු කිරීමට නියමිතය. කේ.ජී.එන්.ටී. ලක්මාල් නැමැති අය විසින් වාරික වශයෙන් ගෙවමින් පැවති අතර 2023 මැයි මස සිට ගෙවීමට නවතා ඇති හෙයින් එම මුදල් ගෙවීමට කටයුතු කරන ලෙස දන්වා නැවත ලිපියක් යොමු කර ඇත.
5	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	2019 වර්ෂය වන විට පැවති වසර 02 ඉක්ම වූ සියළුම තැන්පත් ශේෂ මේ වන විට නිරවුල් කර අවසන් කර ඇත. වැඩ අවසන්ව නොපවතින තැන්පත් දෙකක් හැර අනෙකුත් කල් ඉකුත්වූ තැන්පතු නිරවුල් කිරීමට සම්බන්ධයෙන් 2023 වර්ෂයේ දී මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර ඇත.
6	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ වීය.	ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන කෞතුකාගාර ගොඩනැඟිලි හා ඉඩම් තක්සේරු කර ගිණුම්ගත නොකිරීම මත ගිණුම් සඳහා වන මතය තත්ත්වාගණනය (Qualified Opinion) කර තිබුණි. එම ඉඩම් හා ගොඩනැඟිලි දෙපාර්තමේන්තුවට අයත් ඒවා නොවූ බැවින් අයිතිය පවරා ගැනීමට කටයුතු සිදු කරන ලද අතර, මේ වන විට අයිතිය පැවරූ කෞතුකාගාරවල තක්සේරු වටිනාකම් ගිණුම්ගත කර ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 290

ආයතනයේ නම : ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

	කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු / කාරක සභාව විසින් ලබා දෙන ලද නියෝග	අඩුපාඩු නිවැරදි කිරීමට කම්ටුව විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග/නිර්දේශ ක්‍රියාත්මක කිරීම/ වර්තමාන තත්ත්වය
1	වාහනයක් ගර්හිත වී මාස 8 කට වඩා අඩු කාලයකදි අපහරණය කර නොතිබුණි.	මු.රෙ. 109 ආකෘති පත්‍ර අනුමත කරගෙන මේ වන විට පොතෙන් කපාහැර ඇත.
2	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි.	ආයතනය සතු සංචිත වාහනයේ ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් සිදු කර ඇත.
3	මු .රෙ.94 (1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇතිකර ගෙන තිබුණි.	2021 වර්ෂයේ ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැඳීම් ඇති කරගෙන තිබුණද 2022 වර්ෂයේ සිට ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැඳීම් ඇති කර නොගැනීමට කටයුතු කර ඇත.

සෝමරත්න විදානපතිරණ
ලේකම්
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
නො. 135, "දහම්පාය"
ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත,
කොළඹ - 07.

.....

සෝමරත්න විදානපතිරණ

ලේකම්,

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

විදුර වික්‍රමනායක
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
නො.135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත,
කොළඹ - 07.

.....

විදුර වික්‍රමනායක,

ගරු. අමාත්‍ය,

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

ඇමුණුම 01

මිය ගිය නිලධාරීන්							
අනු අංක	ණය හිමියාගේ නම	ණය වර්ගය	ණය මුදල 2021.12.31 දිනට	ණය අයවීම්	කපාහැරීම්	තවදුරටත් අයකරගතයුතු ශේෂය 2023.12.31 දිනට	කල්ගත වීමට හේතු සහ වර්තමාන තත්වය
1	ඩබ්.ඒ.ඩී.නිලකරත්න මයා	ආපදා ණය	101,300	30,000	-	71,300	2022.05.18 වන දින ඔහුගේ බිරිඳගේ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුපෙන් රු.1500/- බැගින් අයකර අප අමාත්‍යාංශයට ලබා දීමට කටයුතු කරන ලෙස දන්වා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත ලිපියක් යොමු කර ඇත. 2023.01.31 වන දින විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත ලිපියක් යොමු කර ඇත. එම ලිපියට පිළිතුරු ලෙස 2023.03.30 වන දින විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් තොරතුරු කිහිපයක් ඉල්ලා ලිපියක් යොමු කර ඇත. ඊට අදාල තොරතුරු 2023.04.10 වන දින ඊට පිළිතුරු ලිපිය යොමු කරන ලදී. 2023.07.04 වන දින චෙක් පතකින් යොමු කර ඇත. මාසිකව එම මුදල එවන ලෙස දන්වා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත 2023.08.15 වන දින ලිපියක් යොමු කර ඇත.විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරි විසින් එන්.ඒ.ඩී.එම්.ස්වර්ණලතා මියගේ විශ්‍රාම වැටුපෙන් රු.5000 බැගින් චෙක්පතකින් අය කර ගනිමින් සිටියි.
2	ඒ.ධම්මිකා ද සිල්වා මිය	ආපදා ණය	36,450.00	26,730.00	-	9,720.00	ඇපකරුවන්ගෙන් මාසිකව අයකර ගනිමින් පවති.
3	ඒ.ජී.කේ.එම්.ඩබ්. හින්බණ්ඩා මයා	උත්සව ණය	5,000.00		5,000.00	-	රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 අනුව I කොටසෙහි 3.1 හි මු.රෙ.113 (60 (අ) හි දැක්වෙන පරිදි රු.25,000/= නොඉක්මවන හිඟ ණය ශේෂ කපා හැරීමට ප්‍රධාන ගණන් නිලධාරියාට ලැබී ඇති බලය අනුව එම නිලධාරියාගේ හිඟ ණය ශේෂය වන රු.5000 කපා හැරීමට කටයුතු කර ඇත.(මාරුපත්‍ර දිනය 2023.09.22)

4	ආර්.ඩී. ජගත් සිරි කුලතුංග	ආපදා ණය	197,666	197,666	-	-	ණය මුදල නිරවුල් කර ඇත.(මාරු පත්‍රයක් මඟින් 2022.02.28)
5	එස් .එන්.ජේ. විජේදාස	ආපදා ණය	25,938.88	25,938.88	-	-	ණය මුදල නිරවුල් කර ඇත.(මාරු පත්‍රයක් මඟින් 2022.02.28)
6	ජී.ජී.බී. කරුණාදාස	ආපදා ණය	55,760.00		-	55,760.00	මෙම නිලධාරිනියගේ පත්වීම ස්ථිර නොවන හෙයින් මරණ පාරිතෝෂිතයෙන් අය කර ගැනීමට නොහැක. පත්වීම් ස්ථිර ලිපිය ලැබුණු පසුව මරණ පාරිතෝෂිතයෙන් අයකර ගැනීමට කටයුතු යෙදිය යුතුය. සේවා ස්ථිර ලිපිය කඩිනමින් එවන ලෙස දන්වා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත ලිපියක් 2023.08.15 වන දින යොමු කර ඇත.
7	කේ.ජී. උපාලි		77,245.00	7,425.00		69,820.00	2023 අගෝස්තු මස සිට ඇපකරුවන්ගෙන් මාසිකව අයකර ගනිමින් පවතී. මේ වන විට හිඟ ණය ශේෂය රු.69,820 කි.
	එකතුව		**499,359.88**	**287,759.88**	**5,000.00**	**206,600.00**	

විශ්‍රාම ගිය නිලධාරීන්							
අනු අංක	ණය හිමියාගේ නම	ණය වර්ගය	ණය මුදල	ණය අයවීම්	කපාහැරීම්	තවදුරටත් අයකරගත යුතු ශේෂය	කල්ගත වීමට හේතු සහ වර්තමාන තත්වය
1	**කේ.ඒ.එස්. ආර්. කළුආරච්චි**	ආපදා ණය	128,732.40			128,732.40	ණයකරු විශ්‍රාම වැටුපෙන් අයකරගැනීමට කැමැත්ත ප්‍රකාශ කර ඇතත් මේවන විටත් ඇයගේ විශ්‍රාම වැටුප සැකසී නැත.
2	ඒ.පි.එම්. මෙන්ඩිස්	ආපදා ණය උත්සව ණය	ආපදා-11,630 උත්සව-2500	14,130.00		-	2022.12.21 වන දින මාරුපත්‍ර මඟින් නිරවුල් කර ඇත.
3	ආර්.ජී.එස්. සුහසිංහ	ආපදා ණය	61,740.00	61,740.00		-	2022.12.21 වන දින මාරුපත්‍ර මඟින් නිරවුල් කර ඇත.
4	එස්.ඩබ්.බී.අයි. ශ්‍රියානි	ආපදා ණය	105,020.00	105,020.00		-	2022.06.21 වන දින මාරුපත්‍ර මඟින් නිරවුල් කර ඇත.
	එකතුව		**309,622.40**	**180,890.00**	-	**128,732.40**	

වැඩ තහනම් කළ නිලධාරීන්							
අනු අංක	ණය හිමියාගේ නම	ණය වර්ගය	ණය මුදල	ණය අයවීම්	කපාහැරීම්	තවදුරටත් අයකරගත යුතු ශේෂය	කල්ගත වීමට හේතු සහ වර්තමාන තත්වය
1	ඒ.එම්.සී. බණ්ඩාර	ආපදා ණය	142,520.00	-	-	142,520.00	පදිංචිය තහවුරු කර ගැනීම සම්බන්ධයෙන් වැලිමඩ ප්‍රා.ලේ වෙත 2022.08.08 වන දින ලිපියක් යොමු කර ඇත. මැතිවරණ කාර්යාලය වෙත වර්තමාන පදිංචි ලිපිනය එවන ලෙස දන්වා 2022.08.24 වන දින ලිපියක් යොමු කර ඇත. වැලිමඩ ප්‍රා.ලේ. විසින් පදිංචි තහවුරු කර 2022.09.23 වන දින ලිපියක් යොමු කර ඇත. ආපදා නිහ ණය මුදල ගෙවන ලෙස දන්වා 2023.03.30 වන දින ලිපියක් යොමු කර ඇත. මොහු පිළිබඳ විස්තර ඉල්ලා වැලිමඩ ප්‍රා.ලේ වෙත ලිපියක් 2023.08.15 වන දින යොමු කර ඇත.
2	එස්.එම්.එන් .බී. සමරසිංහ	ආපදා ණය	87,300.00	-	-	87,300.00	නීතිපතිතුමා විසින් ගිණුම් විස්තරයක් එවන ලෙස දන්වා ඇත.ඊට පිළිතුරු ලිපිය 2022.04.18 වන දින යොමු කර ඇත. 2022.06.30 වන දින සවිස්තරාත්මක ගිණුම් වාර්තාවක් නීතිපතිතුමා වෙත යොමු කර ඇත. නීතිපති දෙපාර්තමේන්තුව නීතිපතිතුමා විසින් 2023.03.31 වන දින කඩුවෙල දිසා අධිකරණ නඩුවක් සඳහා නොරතුරු ඉල්ලා ලිපියක් යොමු කර ඇත.ඊට පිළිතුරු 2023.04.11 වන දින යොමු කරන ලදී. නීතිපති දෙපාර්තමේන්තුවෙන් 2023.04.26 වන දින දුරකථන මාර්ග ඔස්සේ අතිරේක ලේකම්තුමියගෙන් ඇපකරු වන එම්. චන්ද්‍රසේකර මයාගේ නොරතුරු ඉල්ලා ඇති අතර ඊට පිළිතුරු 2023.04.27 වන දින යොමු කරන ලදී.
3	එච්.ආර්.සී. එම්. සමරනායක	ආපදා ණය	73,802.00	73,802	-	-	ඇපකරුවන්ගෙන් නිහ ණය මුදල අය කර ගෙන ඇත.

4	එච්.පී. ජයදාස	ආපදා ණය	38,565.00	-	-	38,565.00	2022.02.02 වන දින ණයකරු හා ඇපකරු වෙත හිඟ ණය මුදල ගෙවන ලෙස දන්වා ලිපි යොමු කර ඇත. ඊට අමතරව 2022.07.02 වන දින ණයකරු හා ඇපකරු වෙත ලිපියක් යොමු කර ඇත. ණයකරු වෙත ලිපියක් 2023.03.21 වන දින යොමු කර ඇත. ඇපකරු වන ඩී.ජී. කුලරත්න මයාගේ තොරතුරු ඉල්ලා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - තංගල්ල වෙත 2023.05. 17 වන දින ලිපියක් යොමු කර ඇත.
5	ජේ.එම්. රාහික්	ආපදා ණය	39,230.00	-	-	39,230.00	2022.02.02 වන දින ණයකරු හා ඇපකරු වෙත හිඟ ණය ගෙවන ලෙස දන්වා ලිපි යොමු කර ඇත. ග්‍රාම නිලධාරී දුරකථන අංකය සම්බන්ධ කර ගත නොහැක. මැතිවරණ කාර්යාලය වෙත වර්තමාන පදිංචි ලිපිනය එවන ලෙස දන්වා 2022.08.24 වන දින ලිපියක් යොමු කර ඇත. මැතිවරණ කාර්යාලයෙන් 2022.09.06 වන දින පිළිතුරු ලිපියක් යොමු කර ඇත. ආපදා හිඟ ණය මුදල ගෙවන ලෙස දන්වා ණයකරු හා ඇපකරු වෙත ලිපියක් 2023.03.21 වන දින යොමු කර ඇත.
6	කේ.කේ.එන්. කුලරත්න	ආපදා ණය	50,610.00	15,000.00	-	35,610.00	ණයකරු විසින් වාරික වශයෙන් ගෙවන බවට පොරොන්දු වී ඇත.
7	කේ.ඒ.ආර්. නිශාන්ත	ආපදා ණය උත්සව ණය	106,650.00 4,000.00		-	110,650.00	මෙම ණයකරුගේ ණය ලිපිගොනුව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ඇතිමුත් තාම එය අප අමාත්‍යාංශයට ලැබී නොමැත.
8	එම්.එස්. සබීර්	උත්සව ණය	5,000.00	-	5,000.00	-	රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 අනුව I කොටසෙහි 3.1 හි මු.රෙ.113 (60 (අ) හි දැක්වෙන පරිදි රු.25,000/= නොඉක්මවන හිඟ ණය ශේෂ කපා හැරීමට ප්‍රධාන ගණන් නිලධාරියාට ලැබී ඇති බලය අනුව එම නිලධාරියාගේ හිඟ ණය ශේෂය වන රු.5000 කපා හැරීමට කටයුතු කර ඇත.
9	එච්.ටී.පී.විජිත කුමාර	ආපදා ණය	33,145.00	17,000.00	-	16,145.00	වාරික වශයෙන් මුදලින් ගෙවමින් පවතින අතර මේ වන විට හිඟ ණය ශේෂය රු.16,145 කි.

10	ඩී.එන්.ඩබ්. ශනාල් රන්දිම	ආපදා ණය උත්සව ණය	ආපදා-73,640 උත්සව-6250	35,050.00	-	44,840.00	ආපදා හිඟ ණය මුදල ඇපකරුවන්ගෙන් අය කරගනිමින් පවතින අතර, මේ වන විට ශේෂය රු.44,840 කි. උත්සව අත්තිකාරම් හිඟ ණය මුදල රු.6250 කි. ලියාපදිංචි තැපෑලෙන් අදාළ උත්සව අත්තිකාරම් හිඟ ණය ශේෂ ගෙවන ලෙස තවදුරටත් දැන්වීමෙන් පසුවත් අයකර ගැනීමට අපහසු වුවහොත් රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 අනුව I කොටසෙහි 3.1 හි මු.රෙ.113 (60 (අ) හි දැක්වෙන පරිදි ඉදිරි කටයුතු කිරීමට සටහන් කර ගනිමි.
11	කේ.එම්. කේ.සී. බණ්ඩාර	උත්සව ණය	7,500.00	-	-	7,500.00	වහාම ණය ශේෂ නිරවුල් කරන ලෙස දන්වමින් ලිපියක් යොමුකර ඇත.
12	ඩබ්.යූ.ඩී. අල්විස්	ආපදා ණය උත්සව ණය	ආපදා-60,680 උත්සව - 7500	58,252.00		9,928.00	ආපදා ණය මුදල ඇපකරුවන්ගෙන් අය කරගනිමින් පවතී. මේ වන විට ආපදා හිඟ ණය ශේෂය රු.2428 කි. උත්සව අත්තිකාරම් හිඟ ණය ශේෂය රු.7500 කි. ලියාපදිංචි තැපෑලෙන් අදාළ උත්සව අත්තිකාරම් හිඟ ණය ශේෂ ගෙවන ලෙස තවදුරටත් දැන්වීමෙන් පසුවත් අයකර ගැනීමට අපහසු වුවහොත් රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 අනුව I කොටසෙහි 3.1 හි මු.රෙ.113 (60 (අ) හි දැක්වෙන පරිදි ඉදිරි කටයුතු කිරීමට සටහන් කර ගනිමි.
	එකතුව		**736,392.50**	**199,104.00**	**5,000.00**	**532,288.00**	

අනියම් තාවකාලික වැටුප් ලබන නිලධාරීන්

අනු අංක	ණය හිමියාගේ නම	ණය වර්ගය	ණය මුදල	ණය අයවීම්	කපාහැරීම්	තවදුරටත් අයකරගතයුතු ශේෂය	කල්ගත වීමට හේතු සහ වර්තමාන තත්වය
1	එම්.කේ.එම් .ඩී. අල්විස්	උත්සව ණය	1,000.00		1,000.00	-	රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 අනුව I කොටසෙහි 3.1 හි මු.රෙ.113 (60 (අ) හි දැක්වෙන පරිදි රු.25,000/= නොඉක්මවන හිඟ ණය ශේෂ කපා හැරීමට ප්‍රධාන ගණන් නිලධාරියාට ලැබී ඇති බලය අනුව එම

							නිලධාරියාගේ හිඟ ණය ශේෂය වන රු.1000 කපා හැරීමට කටයුතු කර ඇත. (මාරු පත්‍රයක් මඟින් 2023.09.22)
	එකතුව		1,000.00	-	1,000.00	-	

සේවය අත්හැර ගොස් ඇති නිලධාරීන්							
අනු අංක	ණය හිමියාගේ නම	ණය වර්ගය	ණය මුදල	ණය අයවීම්	කපාහැරීම්	තවදුරටත් අයකරගතයුතු ශේෂය	කල්ගත වීමට හේතු සහ වර්තමාන තත්වය
1	ඩී.සී.එස්. කුඹුකගේ	ආපදා ණය	104,258.00	-	-	104,258.00	මෙම ණය මුදල කපා හැරීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කර ඇත.
2	ආර්.පී.ඩී.එන්. ජයවීර	ආපදා ණය	68,200.00	68,200.00	-	-	2022.02.14 දින එම හිඟ ණය මුදල අයකර ගෙන ඇත.
3	ඩී.එල්.කේ. ගමගේ	ආපදා ණය	60,100.00	40,000.00	-	20,100.00	රු. 40,000 ක මුදලක් ගෙවා ඇත. (22.01.10- රු 20000/- හා 2022.02.21 -20000/-) හිඟ ණය මුදල වන රු. 20,100.00 ක මුදල ගෙවීමට දන්වා 2023.01.27 වන දින ලිපියක් යොමු කර ඇත. හිඟ ණය මුදල වන රු. 20,100.00 ක මුදල ගෙවීමට දන්වා 2023.07.12 වන දින ලිපියක් යොමු කර ඇත.
4	ආර්.කේ.එන්. ප්‍රීති කුමාර	ආපදා ණය	96,130.00	-	-	96,130.00	2022.02.02 වන දින ණයකරු හා ඇපකරු වෙත හිඟ ණය ගෙවන ලෙස දන්වා ලිපි යොමු කර ඇත. ග්‍රාම නිලධාරී අමතා ලිපිනය පිළිබඳව තොරතුරු ලබා ගන්නා ලදී.මැතිවරණ කාර්යාලය වෙත වර්තමාන පදිංචි ලිපිනය එවන ලෙස දන්වා 2022.08.24 වන දින ලිපියක් යොමු කර ඇත. මැතිවරණ කාර්යාලයෙන් 2022.09.06 වන දින පිළිතුරු ලිපියක් යොමු කර ඇත. ආපදා හිඟ ණය මුදල ගෙවන ලෙස දන්වා ණයකරු වෙත ලිපියක් 2023.03.10 වන දින යොමු කර ඇත.

5	සී.බී.ආර්.එන්.එම්. බණ්ඩාර	ආපදා ණය	190,580.22	38,000.00	-	152,580.22	වාරික වශයෙන් මුදලින් ගෙවමින් පවතියි (22.10.12 - රු. 8000/-, 22.11.21 - රු.10000/- 22.12.27 - රු.10000/- , 23.02.15 - රු.10000/-)
	එකතුව		**519,268.22**	**146,200.00**	-	**373,068.22**	

	මුළු එකතුව		2,065,643.	813,953.88	11,000.00	1,240,689.12	